# ප්‍රජා විද්‍යාත්මක හා සෞඛ්‍ය සමීක්ෂණ - 2006

## <u>සම්බන්ධීකරණ නිලධාරීන්ගේ කාර්භාරය.</u>

1. තමන්ට පවරා ඇති දිස්ත්‍රික්ක වල සම්බන්ධීකරණ කටයුතු සියල්ලම ඒ ඒ දිස්ත්‍රික්කවල කණ්ඩායම් භාර අධීක්ෂණ නිලධාරීන් මගින් සොයා බැලීම. අවශ්‍ය විටදී DHS ඒකකයේ උපදෙස් ලබා ගැනීම.

2. ක්ෂේත්‍ර කටයුතු වල නිරත වන කණ්ඩායම් වල සාමාජිකාවන්ගේ යම් වෙනසක් වේ නම් (අසනීප නිසා හෝ වෙනත් හේතුවක් නිසා සමීක්ෂණ කටයුතු වලට නොපැමිණිය හොත්) ඒ බව DHS ඒකකයට දැනුම් දීම.

3. වාහන ගැටළු හෝ. නිවාස ගැටළු ඇතොත් එවා DHS ඒකකය සමග සාකච්ඡා කර විසඳා ගැනීමට පියවර ගැනීම.

4. සමීක්ෂණය කර අවසන් වූ විශේෂ සංගණන කාණ්ඩ වල උපලේඛන DHS ඒකකයට රැගෙන එමට අවශ්‍ය කටයුතු ක්ෂේත්‍ර මෙහෙයුම් අංශය සමග සම්බන්ධීකරණය කිරීම.

5. ඒ ඒ කණ්ඩායමට ලබා දී ඇති බර මනින උපකරණයේ ක්‍රියාකාරිත්වය නිසි පරිදි සිදු වනවාදැයි මිණුම්කරුවන් විසින් පරීක්ෂා කළ යුතු අතර එහි දෝෂයක් වෙතොත් කණ්ඩායම් භාර අධීක්ෂණ නිලධාරියා මගින් සම්බන්ධීකරණ නිලධාරී දැනුවත් කළ යුතුය. සම්බන්ධීකරණ නිලධාරී ඒ පිළිබඳව DHS ඒකකය දැනුවත් කර විසඳුම් ලබා ගත යුතු වේ.

6. මීට අමතරව නොබෝ දිනකින් ලබා දෙන ක්ෂේත්‍ර පරීක්ෂා වගු සමග තම කණ්ඩායම්වල නිවැරදිතාවයන් යන දෝෂ පිළිබඳව ඔවුන් දැනුවත් කළ යුතුව ඇත.

7. නියැදියට තේරී ඇති ගෘහ ඒකක වල වෙසෙන වයස අවුරුදු 15-49 (15 හා 49 ඇතුළුව) අතර කාන්තාවන් හා වයස අවුරුදු 6ට අඩු හා ළමුන් නිසි පරිදි සමීක්ෂණයට භාජනය කර ඇත් දැයි පරීක්ෂා කිරීම. මෙහිදී වයස ගණන් ගත යුත්තේ සමීක්ෂණයට යන දිනය අනුව පසුගිය උපන්දිනයට සම්පූර්ණ කළ වයසය.

8. සම්බන්ධීකරණය කරනු ලබන දිස්ත්‍රික්ක වල මසකට වරක් (උපරිම මසකට 2වරක්) ක්ෂේත්‍ර නිරීක්ෂණ කටයුතු කිරීම. ක්ෂේත්‍රයට යාම සඳහා DHS ඒකකයේ අධ්‍යක්ෂිකා මගින් අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය වේ. ක්ෂේත්‍ර නිරීක්ෂණ කටයුතු නිමා කල පසු හැකි ඉක්මනින් ඒ පිළිබඳ වාර්තාවක් DHS ඒකකයට එවීම. ක්ෂේත්‍ර පරීක්ෂණ වලදී පහත කරුණු පිළිබඳව සැලකිලිමත් විය යුතුවේ.

    - අනිවාර්යයෙන්ම ක්ෂේත්‍ර සංස්කාරවරයා මුණගැසී ඔහු සහතික කළ උපලේඛන කිහිපයක් පරීක්ෂාවට ලක් කළ යුතුය.
    - නියැදියට තේරී ඇති නිවාස ඒකකම සමීක්ෂණයට භාජනය කර ඇත්දැයි සොයා බැලීම. (අහඹු ලෙස නිවාස 5 ක් පරීක්ෂාවට ලක් කිරීම සුදුසු වේ.)
    - නැවත වාරයක් සමීක්ෂණය සඳහා යා යුතු ගෘහ ඒකකවලින් තොරතුරු ලබා ගැනීමට අපහසු අවස්ථා වලදී ඒ සඳහා මැදිහත් වී එම තොරතුරු ලබා ගැනීමට අවශ්‍ය කටයුතු කිරීම.

- සැක සහිත අවස්ථා වලදී නැවත පරීක්ෂාවලට ලක් කිරීම මගින් නිවැරදිතාවය තහවුරු කිරීම. එනම් අන්ත වයස් කාණ්ඩවල සිටින සුදුසු කාන්තාවන් සමීක්ෂණයට භාජනය කිරීම පිළිබඳව නිරවද්‍ය බව තහවුරු කිරීම. ( විශේෂ වයස් වනුයේ 15, 49, අවුරුදු 6 ට අඩු දරුවන්)
- මිය ගිය දරුවන් සිටී නම් ඒවා නිවැරදිව 2 කොටසේ ඇතුලත් කර ඇත්දැයි පරීක්ෂා කිරීම. යම් විශේෂ කාණ්ඩයක් සඳහා එක් මිය ගිය දරුවකු හෝ නොසිටී නම් එහි නිරවද්‍යතාවය පිළිබඳව සැකයක් මතුවිය හැකි බැවින් ඒ පිළිබඳව පරීක්ෂාකාරී විය යුතුය. විශේෂයෙන්ම සුනාමියෙන් විනාශ වූ ප්‍රදේශ වලට මෙය වැදගත් වේ.
- නිවුන් දරුවන් සිටී නම් ඔවුන් 2 කොටසේ නිරවද්‍යව ඇතුලත් කර ඇත්දැයි පරීක්ෂා කිරීම.
- නිවුන් දරුවන්ගෙන් එක් අයෙක් මියගොස් නම් ජීවත්වන දරුවා බාලම දරුවා ලෙස ගත යුතුය.
- 2 කොටසේ උපත් වගුවේ දරුවාට අදාල පේළි අංකය 4 හා 5 කොටස් වල දී සඳහන් කර ඇත්දැයි බැලීම.
- උපත් පරතරය නිරවද්‍යදැයි පරීක්ෂාවට භාජනය කිරීම.
- ප්‍රශ්න අංක 120 හි සඳහන් වර්ෂය හා මාසය 2 කොටසේ උපත් වගුවේ පලවන උපත අතර පරතරය මාස 9 ක් හෝ ඊට වැඩි විය යුතු අතර පරතරය මාස 7 හෝ 8 නම් එය නිවැරදි බව තහවුරු කර සම්මුඛ පරීක්ෂකවරියන්ගේ සටහන් එහි යොදා තිබිය යුතුය. ඔය මාස 6 ට අඩු නම් දෝෂයක් ඇති බැවින් එය නිවැරදි කිරීමට අවශ්‍ය වේ.
- ප්‍රශ්න අංක 462, 465A හා 470 අතර ගැලපුම පරීක්ෂාවට ලක් කළ යුතුය. එනම් පලමු මාස 4 තුලදී මව් කිරි පමණක් දී ඇත්නම් අමතර ආහාර මුලින්ම දීම මාස 5 හෝ ඊට වැඩි අගයක් ගත යුතු වේ.
- ලුණු පරීක්ෂාවට භාජනය කළ යුත්තේ වැඩියෙන්ම භාවිතා කරන ලුණු වර්ගයට අදාලව නමුත් සමහර අවස්ථා වලදී වැඩියෙන්ම භාවිතා කරන ලුණු වර්ගය ගෘහයේ නැති අවස්ථා හමුවේ. මෙවිට අනෙක් ලුණු වර්ගය භාවිතා කර පරීක්ෂණය කර ප්‍රතිඵල සටහන් කිරීම නොකළ යුතු බව කණ්ඩායම් වල අධීක්ෂණ නිලධාරී ඇතුළු සම්මුඛපරීක්ෂකවරියන් දැනුවත් විය යුතුය.
- සමහර ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමේදී දෙනු ලබන පිළිතුරට අදාලව කේතය කව කළ හැකි විටදී වෙනත් යටතේ ලියන අවස්ථා ඇත. මෙය නැවතත් කාර්‍යාලයේ සංස්කරණය කළ යුතු බැවින් පිළිතුරට අදාල කේතය කව කිරීමට වග බලා ගත යුතු බව කණ්ඩායම් සාමාජිකාව දැනුවත් කළ යුතුය.

අධ්‍යක්ෂ,
DHS ඒකකය.